# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

## 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාවන් සැපයීම.

- අයදුම්පත්‍රය
- නියමයන් හා කොන්දේසි

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 70,
පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

දු.ක 011-7909020/21

# සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සැපයීමේ අයදුම්පත්‍රය
# (කොන්දේසි හා නියමයන් සහිතයි)
# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# 2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා

<u>මෙම අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට ආපසු ගෙවනු ලබන රු.20,000/- ක ලංසු සුරක්ෂිත ගාස්තුවක් මෙම අධිකාරියේ මුදල් අංශය වෙත ගෙවා ලබා ගන්නා ලදුපතෙහි පිටපතක්ද සමඟ</u> මුද්‍රා තබන ලද මිල ගණන් **2024.10.22** .දින ප.ව **2.00** ට පෙර ලැබෙන සේ මුල් පිටපත හා අනු පිටපත ලෙස සඳහන් කොට පිටපත් 02 කින් යුක්තව මිල ගණන් ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ කාර්යාලයට පැමිණ මුදල් අංශයේ, සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා ටෙන්ඩරය සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් යොමු කරන්න.

ලංසු ලේඛන බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"2025 වර්ෂයේ සනීපාරක්ෂක සේවා සඳහා මිළ ගණන්"** යනුවෙන් සඳහන් කරන්න.

සියළු ලංසු ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටු සභාපති සතුය.

<u>ආයතනික කරුණු හා සැපිරිය යුතු අවශ්‍යතා</u>

01. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා ආයතනයේ නම :
02. ලිපිනය :
03. ව්‍යාපාර ලියාපදිංචි අංකය :
    (අදාල ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණන්න.)
04. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සැපයීම සඳහා රජයේ අනුමැතිය ලත් වලංගු සහතික :
05. ආයතනයේ සේවා පළපුරුද්ද :
    (අවම වශයෙන් වසර 05 ක් විය යුතුය.)
06. වසර 03 ක විගණන හා මූල්‍ය වාර්තා විස්තර :
    (අදාල ලේඛන අමුණන්න.)
07. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සපයා ඇති ආයතන වල ලේඛනය :
    (අදාල ලේඛන අමුණන්න.)
08. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සපයන ආයතනයේ පරිපාලන ව්‍යුහය හා ආයතනයේ මානව සම්පත් හා භෞතික සම්පත් පිළිබඳ සියළු තොරතුරු ඇතුලත් වාර්තාවක් :

09. ලංසු කැඳවීම අවසන් කල දින සිට ඉදිරියට දින 90 ක් බලපැවැත්වෙන පරිදි ඉදිරිපත් කල ලංසු සුරක්ෂිතය ගෙවූ බවට තහවුරු වන ලදුපත :

10. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සැපයීමේ ගාස්තු :

| සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සැපයිය යුතු අංශය | යොදවන සේවකයින් ගණන | අයකරන ගාස්තුව (මාසිකව) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | එක් සේවකයෙකුට අය කරන බදු රහිත අගය | | මුළු මාසිකව අය කරන මුදල බදු රහිත අගය | | බදු සහිතව මාසිකව අය කරන මුළු මුදල | |
| | | රු. | ශත | රු. | ශත | රු. | ශත |
| ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල හා එහි අවට භූමිය | | | | | | | |
| ඉදිරි මාස 12 ක කාලය සඳහා අය කරන මුළු මුදල | | | | | | | |

- බදු වර්ග සහිත මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම් අදාල බදු වර්ගය සඳහන් කල යුතුය.
- VAT බදු ඉල්ලුම් කරන්නේ නම් ඊට අදාල VAT බදු ඉන්වොයිස් පතක් ඇමිණිය යුතුය.

## සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා ලබා ගැනීමට අදාල කොන්දේසි

01. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙහි පිහිටි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල හා එහි අවට භූමිය (රූඩ් 02 පර්චස් 32) පිරිසිදුව මනාව නඩත්තු කරගෙන පවත්වාගෙන යාමට එකගව මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

02. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව ලබා දීමට සුදුසුකම්ලත් ආයතනය විසින් එකග වූ මිල ගණන් යටතේ ගිවිසුම්ගත කාලය පුරාම සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සැපයීමට එකගත්වය පල කල යුතු වේ. ගිවිසුම්ගත කාලය පුරාම සේවාව සැපයීම සඳහා එකග වූ සම්පූර්ණ මුදලෙන් (1/12 ක් බැගින්) මාසිකව අදාල සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සපයනු ලබන ආයතනය විසින් ඉදිරිපත් කරනු ලබන බිල්පත් වලට අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ගෙවීම් කටයුතු කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන බිල්පත් ඉදිරි මාසයේ 15 වන දිනට පෙර ගෙවීමට කටයුතු කරනු ඇත.

03. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සුදුසුකම් ලබන ආයතනය වෙත අවශ්‍ය උපකරණ හා රසායන ද්‍රව්‍ය සැපයීම කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ඇත.

04. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සපයනු ලබන සේවකයින් විසින් ආයතනයේ කාර්යය මණ්ඩලයට හා පිටතින් පැමිණෙන අමුත්තන් හට විනීතව හා ගෞරව පූර්වකව සැලකීමට කටයුතු කල යුතු වේ.

05. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සඳහා සුදුසුකම් ලබන ආයතනය විසින් මෙම අධිකාරියේ නියමය පරිදි රු.50,000/- ක ආරක්ෂක තැන්පතු මුදලක් කොන්ත්‍රාත් කාලය හා එම කාලය අවසන්ව දින 60 ක කාලයක් ඉදිරියට මෙම අධිකාරියේ මුදල් අංශයේ තැන්පත් කිරීම හෝ එම කොන්දේසි පරිදි එම වටිනාකමින් යුතු වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත ඇප සුරැකුමක් ඉදිරිපත් කල යුතුය.

06. දෙපාර්ශවයේම එකගත්වය මත සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාවන් එක් ලිත් මාසයක කල් දීමෙන් අනතුරුව සේවයෙන් ඉවත්වීමට හෝ ඉවත් කිරීමට දෙපාර්ශවයටම අයිතිය ඇත. එමෙන්ම ඉහත වගන්තියට පරිබාහිරව දෙවන පාර්ශවය සපයනු ලබන සනීපාරක්ෂක කටයුතුවල දුර්වලතා වාර්තා වුවහොත් වහාම දැනුම් දීමකින් පසු දෙවන පාර්ශවය සනීපාරක්ෂක කටයුතුවලින් ඉවත්කිරීමට පලමු පාර්ශවයට බලය ඇති බව දෙවන පාර්ශවය පිළිගනී.

07. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම සඳහා නියුක්ත කරන නිළධාරීන් පූර්ණ සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ නිළ ඇඳුමෙන් සැරසී සේවයේ යෙදවිය යුතුය. අදාල නිළ ඇඳුම් සනීපාරක්ෂක සේවා සපයන ආයතනය වන දෙවන පාර්ශවය විසින් සැපයිය යුතුය.

08. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී ගිවිසුම්ගත කාල සීමාව පුරා ඉදිරිපත් කර ඇති මිල ගණන් යටතේ අඛණ්ඩව සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සැපයීමට එකගව මිල ගණන් ඉදිරිපත් කල යුතුය. ගිවිසුම්ගත කාලසීමාව තුල රජයේ හෝ පඩිපාලක සභා නියමයන්ට අනුව අමතර දීමනා හෝ කිසිවක් වැඩිකොට ගෙවීම් නොකරනු ඇත.

09. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සැපයීමේ කාල සීමාව පුරාම අවුරුදු 25 ට වැඩි හා අවුරුදු 55 ට අඩු සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ නිළධාරීන් සේවයේ යෙදවිය යුතුය.

10. අවස්ථානුකූලව සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ කටයුතු වලට අදාලව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් පනවනු ලබන නීතිරීති වලට අනුකූලව කටයුතු කල යුතුය.

11. ලංසු සුරක්ෂණ ලංසු කැදවීම අවසන් කල දින සිට ඉදරියට දින 90 ක කාලයක් සඳහා ඉදිරිපත් කළයුතු අතර, ලංසු සුරක්ෂණ පරිදි ගාස්තු ගෙවීම් කල රු.20,000/-ක් වටිනා අංක ............................ ලදුපතෙහි පිටපතක් මේ සමග අමුණා ඇත. (ලදුපත් අංකය සඳහන් කරන්න.)

12. සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව සැපයීමට තෝරාගත් ආයතනය මෙම කොන්දේසි හා අවශ්‍යතාවය පරිදි ඇතුලත් කරන ලද වගන්ති ඇතුලත් විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කල යුතු වේ.

13. බිම් මහල සමග මහල් තුනකින් අදාල පරිශ්‍රය සමන්විත අතර, සියළුම මහල් වල වැසිකිළි සංඛ්‍යාව 15 ක් වේ.(රාජකාරී දින වල පැමිණ පරිශ්‍රය පරීක්ෂා කල හැක.) එම සියළුම වැසිකිළි මනාව සෞඛ්‍යාරක්ෂිත ලෙස පිරිසිදු කිරිමට එකගව මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

14. ජනෙල්, දොරවල්, අත්වැටවල් හා බිත්ති ඇතුළු සියළුම (අංශවල ඇතුලත පරිශ්‍ර හැර) ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගොඩනැගිල්ල හා අවට භූමිය මනාව නඩත්තු කොට පවත්වාගෙන යාමට එකඟව මිල ගණන් ඉදිරිපත් කල යුතුය. අලංකාරයට සාදා ඇති පැළ වලට ජලය යෙදීම, තණ පිට්ටනිය නඩත්තුව පොහොර යෙදීම හා ජලය යෙදීම, පිරිසිදු කිරීම්ද ඇතුලත්ව අදාල මිල ගණන් ඉදිරිපත් කල යුතුය. අදාල ද්‍රව්‍ය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් සපයනු ඇත.

15 පලමු පාර්ශවයේ නිලධාරියෙකු මගින් සියලු පිරිසිදු කිරීම් කටයුතු අධීක්ෂණය කරනු ලබන අතර ගෙවීම් කිරීමේ දී එකී නිලධාරියාගේ නිර්දේශ සැලකිල්ලට ගනු ලබයි. එමෙන්ම පිරිසිදු කිරීම් කටයුතුවල දුර්වලතා වාර්තා වුවහොත් මාසික ගෙවීම්වලින් 0.5% ක් ලෙස එක් දිනක් සඳහා අඩුකිරීමට පලමු පාර්ශවයට බලය ඇති බව දෙවන පාර්ශවය පිළිගෙන එකගව බැදේ.

16. උදෑසන 08.30 ට පෙර සියළුම පරිශ්‍ර මනාව පිරිසිදු කොට තැබිය යුතු අතර, සියළුම වැසිකිළි උදෑසන 8.30 ට පෙර හා මධ්‍යාහ්න 12.00 ලෙස වාර 02 ක් පිරිසිදු කිරීම කල යුතුය.

17. අදාල නීති රීති වලට අනුකූලව ඉදිරිපත් කර නොමැති ලංසු ලේඛණ ප්‍රතික්ෂේප කිරීමේ බලය අධිකාරිය සතු වේ. සියළුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ හා අවලංගු කිරීමේ බලය මෙම අධිකාරියේ ප්‍රසම්පාදන කමිටු සභාපති සතු වේ.

ඉහත නියමයන් හා කොන්දේසිවලට අනුකූලව සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාව ලබාදීමට අප ආයතනය මෙයින් එකගත්වය පළ කරන අතර අප ආයතනයේ නිළ මුද්‍රාව සහිත අත්සන් පහතින් දක්වා ඇත.

..............................................

ආයතනයේ / අයිතිකරුගේ නම

නිළ මුද්‍රාව

(ව්‍යාපාර ලියාපදිංචියේ සදහන් පරිදි සදහන් කරන්න)

දිනය : ......................................